XII වැනි පරිච්ඡේදය

12:12 ඉද්දා පිලිපැදීම සඳහා නිවාඩු අදාල වර්ෂයේ සහ තමාගේ මුළු සේවා කාලය තුළම පාවිච්චියට නොගෙන ඉතිරිව ඇති විවේක (සමුච්චිත හා ඉකුත් නිවාඩු) නිවාඩු හිලව් කරමින් රජයේ සේවයේ නියුතු මුස්ලිම් කාන්තාවකට ඉද්දා පිලිපැදීම සඳහා මාස 04 දින 10 ක් නොඉක්මවන පරිදි නිවාඩු ලබාදිය හැකිය. මෙම දින ගණන ඉක්මවන නිවාඩු) කාලය වැටුප් රහිත නිවාඩු විය යුතුය.

12:13 සේවා වනිතා සාමාජිකයෙකු වන රජයේ නිලධාරියෙකුට සේවා වනිතා රුස්වීම් වලට සහභාගීවීම සඳහා මසකට පැය 1 ක (පැයක) නිවාඩුවක් දිය යුතුය.

13. රාජකාරි නිවාඩු

13:1 සම්මේලනයකට සහභාගීවීම බඩු මිලට ගැනීම හෝ සැපයීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම බඩු සහ උපකරණ පරීක්ෂා කිරීම ගිවිසුම් අත්සන් කිරීම වැනි හුදෙක්ම රජයේ කටයුත්තක් සම්බන්ධයෙන් රජය විසින් යම් නිලධාරියෙකු පිටරටකට යවනු ලබන කල්හි ඒ සඳහා රාජකාරියෙහි නියුක්ත වන කාල පරිච්ඡේදයත් ගමනට ගතවන අඩුම කාල පරිච්ඡේදයත් සඳහා රාජකාරි නිවාඩු දිය යුතුය.

13:2 රාජකාරිය සඳහා කැඳවනු ලබන විට හෝ වාර්ෂික අභ්‍යාස කඳවුරු වලට සති අන්ත කඳවරු වලට සහ යුද්ධාභ්‍යාස පන්ති වලට යාමට නියම කරනු ලබන විට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ හෝ ස්වේච්ඡා හමුදාවක සාමාජිකයෙකු වන රජයේ නිලධාරියෙකුට රාජකාරි නිවාඩු දිය යුතුය

13.3 රාජකාරි සඳහා කැඳවනු ලබන විට හෝ පුහුණුවීමේ කඳවුරු වලට යාමට නියම කරනු ලබන විට හෝ විශේෂ පොලිස් උපසේවයේ සාමාජිකයෙකු වන රජයේ නිලධාරියෙකුට රාජකාරි නිවාඩු දිය යුතුය.

13.4 විනය පරීක්ෂණයකදී චූදිත නිලධාරියෙකු වෙනුවෙන් පෙනී සිටීමට අවසර දී ඇති නිලධාරියෙකුට එම පරීක්ෂණය සඳහා යාමට රාජකාරි නිවාඩු දිය යුතුය. එසේම එම පරීක්ෂණයට අදාල ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහාත් එබඳු නිලධාරියෙකුට සැහෙන දින ගණනක් රාජකාරි නිවාඩු දිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් කැඳවනු ලබන නිල සාක්ෂි කරුවෙකුටද එවැනි පරීක්ෂණයකට සහභාගි වීමට රාජකාරි නිවාඩු දිය යුතුය.

13.4.1 ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ සංස්ථාවක නීති රීති යටතේ පවත්වන විනය පරීක්ෂණයකදී එවැනි ආයතනයක චූදිත නිලධාරියෙකු වෙනුවෙන් පෙනී සිටීමට අවසර දී ඇති රජයේ නිලධාරියෙකුට එම පරීක්ෂණය සඳහා යාමට රාජකාරි නිවාඩු දිය යුතුය. එසේම එම පරීක්ෂණයට අදාල ලියකියවිලි පරීක්ෂා කිරීම සඳහාත් එබඳු නිලධාරියෙකුට සැහෙන දින ගණනක් රාජකාරි නිවාඩු දිය යුතුය. මෙසේ අවසර දිය යුත්තේ ඒ සඳහා ඉල්ලීම අදාල ආයතනය ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කර ඇත්නම් පමණි. එසේ නිලධාරියෙකු වෙනුවෙන් පෙනී සිටීමේ අවසරය එම ආයතනයේ පාලන විෂය තුල කෙරෙන විනය කටයුතු වලට සීමා වේ.

මෙහි XIV පරිච්ඡේදයේ 29.8 වන වගන්තිය මෙකී රජයේ නිලධාරියෙකු කෙරෙහි බල නොපවත්වන නමුත් ඔහුට අදාල ආයතනයෙන් ගමන් වියදම් ලබා ගත හැක.

13.5 සිය නිල තත්වය යටතේ උසාවියට කැඳවනු ලැබූ විටද නියුක්ත රාජකාරි කටයුතු හේතු කොට ගෙන උසාවියෙහි පෙනී සිටිය යුතු වන විටද උසාවියට යාම සඳහා නිලධාරියෙකුට රාජකාරි නිවාඩු දිය හැක. රජයේ සාක්ෂි කරුවෙකු වශයෙන් උසාවියට යාම සඳහාද රජයේ නිලධාරියෙකුට රාජකාරි නිවාඩු දිය හැකිය.